නිබන්ධය

# ජනමාධ්‍ය සංදේශ පූර්ව ප්‍රසව කණ්ඩායම් කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය

## "සංදේශවල දූෂණ ස්වභාවය කෙරෙහි විශේෂිතව කෙරෙන අධ්‍යයනය"

ඉදිරිපත් කරනු ලබන්නේ

ටී. නිරෝෂණ

(FGS/03/02/06/2011/17)

ප්‍රවේශ අංකය: 1312
වර්ග අංකය:

දර්ශනපති ජනසන්නිවේදන උපාධිය පූරණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි

ජනවාරි 2016

# නිබන්ධ සාරාංශය (Abstract)

මෙරට නූතන මාධ්‍ය ප්‍රවණතා සලකා බලන කල නොයෙක් අරමුණු වලින් සැදුම්ලත් විවිධ න්‍යාය පත්‍රයන් අනුව කටයුතු කරන මාධ්‍ය ප්‍රවාහයන් ගොඩනැගී ඇත. එක් මාධ්‍ය ආයතනයක් අබිබවා තවත් මාධ්‍ය ආයතනයක් ඉදිරියට යාමට ගොඩනගන සංදේශ හේතුවෙන් ඝෝෂාකාරී, අසහනකාරී, දූෂිත (Polluted) සහ අයහපත් (adversed) සංදේශ ග්‍රාහකයින් තුළ අහිතකර කම්පන ඇති කිරීමේ තත්ත්වයක් උද්ගත වී ඇත. දිනෙන් දින මෙකී ප්‍රවණතාවයන් වර්ධනය වන අතර එකී සංදේශ සියලු මාධ්‍ය ආචාර ධර්මයන් පසෙකලා කටයුතු කරන ආකාරයක් විද්‍යමාන වේ. මිනිසා සිය සිතිවිලි හෙවත් චිත්තවේග සමඟ සන්නිවේදනයේ (Intra Personal Communication) යෙදේ.එමඟින් මනසින් කරන විධානයන් සමඟ සංවාද කර ගනිති. ඉන් ස්වකීය කායික හා මානසික හැසිරීම් රටා තීරණය කරනු ඇත.නිරෝගී මිනිසෙකු තුළ බාහිර සාධකයක් නිසා ඇතිවන අයහපත් කම්පන හේතුවෙන් ඔහු තුළ අසාමාන්‍ය හැසිරීම් රටා, චිත්තවේග හා ප්‍රචණ්ඩකාරී තත්ත්වයන්ද ඇති විය හැකිය. මෙවැනි අයහපත් අසහනකාරී සංදේශ පූර්ව ප්‍රසව අවස්ථාවේ පසුවන කාන්තාවන්ට ද පරිශීලනය කිරීමට සිදුවනු අතර ඉන් විවිධ චර්යාත්මක හා මානසික සංකූලතාද ඇති විය හැකිය. ඒ අනුව වර්තමාන මිනිසාගේ හැසිරීම් තීරණය කිරීමට අන් අය විසින් සාදා නිම කරන ලද, ජනසන්නිවේදන මාධ්‍ය මඟින් ලබා දෙන සංදේශ බලපානු ඇත. මෙහිදි සමාජ විඥානයේ වාහකයන් වශයෙන් ක්‍රියා කරනු ලබන්නේ ජනසන්නිවේදන මාධ්‍යයයි. මිනිසාගේ පැවැත්ම සඳහා කොතෙක් දුරට සිය මධ්‍යම ස්නායු පද්ධතිය අවශ්‍ය වන්නේ ද, ඒ තරමටම සමාජ විඥානයේ පැවැත්ම සඳහා ජනසන්නිවේදන මාධ්‍ය අවශ්‍ය වී ඇත.

මෙම ප්‍රස්තුතයේ ගැටලුව ඇත්තේ පුද්ගල ශරීරයේ ඇති ජෛව විද්‍යාත්මක පද්ධතියේ නොව, සංකේතාත්මක මාධ්‍ය සංස්කෘතියේය. ගැබිණි කාන්තාවන්ගේ මනසේ තැන්පත්ව ඇති ආකල්ප, මාධ්‍ය සංස්කෘතිය මඟින් ගොඩ නගනු ලබන ආකල්ප අතර ඇතිවෙන ගැටුම මීට හේතුවෙනු ඇත. එබැවින් මෙයට ග්‍රහණය වන පුද්ගලයාට මෙම තත්ත්වය දරා ගත නොහැකිව, වටහාගත නොහැකිව කම්පනයට පත්වේ. එම කම්පනය ගර්භණී කාන්තාවන්ට පමණක් නොව කළලයටද අතිශය තීරණාත්මක වීය හැක. එමෙන්ම අප රටෙහි මේ පිළිබඳ ගැඹුරු සමාජ - මනෝ විද්‍යාත්මක (Socio – Psychological) අධ්‍යයනයක් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය ක්ෂේත්‍රය තුළ සිදුවී නොමැත. මතු පිටින් බලන කල මෙම අධ්‍යයනයට භාජනය කර ඇති විෂය වෛද්‍ය විද්‍යාත්මක ප්‍රවේශයකින් අධ්‍යයනය කළ යුතු යැයි කෙනෙකුට හැඟී ගියද වෛද්‍ය විද්‍යාත්මක හැදෑරීමක් මඟින් තෝරාගත් මාධ්‍ය පරාසයක් තුළ පුළුල් සන්නිවේදනාත්මක අධ්‍යයනයක් සිදු වේයැයි අපේක්ෂා කළ නොහැක. ඒ අනුව මෙම පර්යේෂණයේ මූඛ්‍ය අරමුණ වන්නේ දූෂිත (polluted/Adversed) ජනමාධ්‍ය සංදේශ පූර්ව ප්‍රසව (Antenatal/Prenatal) කණ්ඩායම් කෙරෙහි සිදු කරන මානසික හා චර්යාත්මක බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීමයි.එකී ප්‍රස්තුතය සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ක්ෂේත්‍රය තුළ හඳුනා ගැනීමයි.

***තාක්ෂණික පද*** - අයහපත්, දූෂිත, සංදේශ, සමාජ මනෝ විද්‍යාත්මක, පූර්ව ප්‍රසව

## Abstract

In consideration of current media trends in Sri Lanka, we find a number of forces based upon diverse agendas. Noisy, impatient, polluted and adverse media messages used by one media institution to supersede another have made adverse effects on receptors. Day by day these trends are on the rise and it is evident that such media messages have violated all media ethics. Persons engage in intra personal communications and such communications determine their physical and mental behavioral patterns. Adverse effects resulted by external factors may create unusual and arrogant behavioral patterns and emotions in a healthy person. Women in the pre-natal stage too are open to such adverse media messages and such messages may create behavioral and mental complications in them. Accordingly, mass communication acts as the vehicles of human conscience. Central sensory system is significant for human existence likewise, media of mass communication is significant for the existence of human conscience.

The problem is not in the biological system of the human body but in the symbolic media culture. The result would be the conflict between attitudes deposited in the mind of pregnant women and the attitudes created by the media culture. The victim would be shocked as a result of this incomprehensible and unbearable situation. Such shocking experience would be quite decisive not only for the pregnant woman but also for her fetus. Furthermore, no analytical socio-psychological study has been conducted in this regard in the field of Mass Communication and Media Studies. On the surface this may be considered as a study with a medical approach. However, a rich communicative study cannot be expected through a medical approach. Accordingly, the prime objective of this research is to study the mental and behavioral effect of adverse/ polluted media messages on the target group of women in their pre-natal/ ante-natal stage in the context of Media and Communication Studies.


***Technical Words*** – Adverse, polluted, messages, socio-psychological, pre-natal